ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 9th Apr.| 2021

පැමිණිලි පාර්ශවය : ටී.එම්. නාලක චමින්ද පියරත්න මයා,
අංක 590, යාය 05,
සෝල්ලේවැව.

අගතියට පත් අය : ටී.එම්. පාලින්ද ලාල් පියරත්න මයා,
වඳුරාගල, වරාවැව.

වගඋත්තර පාර්ශවය : 01. පො.ප - කේ.වී.පී.සී. දීපාල් මයා,
ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
ගිරිබාව.

02. උ.පො.ප - පී. අබේරත්න මයා,
පොලිස් ස්ථානය,
ගිරිබාව.

03. පො.කො 5926 එස්.ඩබ්ලිව්. සේනාරත්න මයා,
පොලිස් ස්ථානය,
ගල්ගමුව (වර්තමාන)

**පැමිණිලි අංකය : HRC/AP/515/2017**

පැමිණිල්ල :-

පැමිණිලිකාර ටී.එම්. නාලක චමින්ද පියරත්න යන අය සිය පැමිණිල්ල මඟින් ප්‍රකාශ කර ඇත්තේ, ඔහුගේ වැඩිමහල් සහෝදරයා වන ටී.එම්. පාලින්ද ලාල් පියරත්න යන අයව 2017.11.07 වන දින ගිරිබාව පොලීසියේ උප පොලිස් පරීක්ෂක අබේරත්න යන අය විසින් 2013.06.25 වන දින සිදුව ඇති මිනීමැරුමක්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580 / 81 / 82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇති බවය. තම සහෝදරයා මානසික ආබාධයෙන් පෙලෙන අයෙකු බවත්, කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව අත්අඩංගුවට ගෙන බන්ධනාගාරගත කිරීමෙන් ඔහුට අසාධාරණයක් සිදුව ඇති බවත් පැමිණිල්ලෙන් දක්වා ඇත.

<u>අගතියට පත් පැමිණිලිකරුගේ ප්‍රකාශය</u>

අගතියට පත් ටී.එම්. පාලින්ද ලාල් පියරත්න යන අයව ගරු අධිකරණයෙන් නිදහස් කිරීමෙන් පසු අදාළ අධිකරණ නියෝගය සමඟින් 2018.12.06 වන දිනැති ලිපියක් මඟින් කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ, තමා 2017.11.08 දින සිට 2018.10.22 දින දක්වා පුද්ගල ඝාතනයක් සම්බන්ධයෙන් චෝදනාවකට බන්ධනාගාරගතව සිටි බවත්, 2018.10.22 වන දින ගරු අධිකරණයෙන් තමාව නිදහස් කළ බවත්ය. වගඋත්තරකරුවන් තමාව අත්අඩංගුවට ගෙන අසාධාරණයක් සිදුකර ඇති බැවින් සාධාරණයක් ඉටුකර දෙන ලෙස පැමිණිල්ලෙන් ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-**

ගිරිබාව පොලීසියේ ස්ථානාධිපතිවරයා විසින් අංක *OW* 5377/17 යටතේ 2017.11.22 දින කොමිෂන් සභාව වෙත වාර්තාවක් යොමු කරමින් දන්වා ඇත්තේ, තම පොලිස් වසමේ 2013.06.25 දින සිදුවූ වෙඩි තබා මනුෂ්‍ය ඝාතනයක් සිදුකිරීමට අදාළව තමා විසින් කරන ලද විමර්ශනයකින් අනතුරුව ටී. පාලින්ද ලාල් පියරත්න යන අයව 2017.11.07 දින පැය 12.15ට තම ස්ථානයට අයුනුක්ත පොලිස් කොස්තාපල් 5926 සේනාරත්න යන නිලධාරියා විසින් අත්අඩංගුවට ගෙන ඇති බවයි.

<u>පොලිස් කොස්තාපල් 5926 එස්.ඩබ්ලිව්.සේනාරත්න නිලධාරියාගේ ප්‍රකාශය</u>

මෙම පැමිණිල්ලට අදාණ කරුණු ඉදිරිපත් කරමින් ඉහත වගඋත්තරකරු සඳහන් කර ඇත්තේ, 2013.06.25 වන දින සිදුවූ මනුෂ්‍ය ඝාතනයක් සම්බන්ධයෙන් කරන ලද විමර්ශනයේදී අනාවරණය වූ තොරතුරු මත පාලින්ද ලාල් පියරත්න යන අයව සැකපිට ප්‍රශ්න කිරීම සඳහා අත්අඩංගුවට ගත් බවය.

<u>උප පොලිස් පරීක්ෂක පී.ඩබ්ලිව්. අබේරත්න යන අයගේ ප්‍රකාශය</u>

පැමිණිලිකරු තම පැමිණිල්ල මඟින් ප්‍රකාශ කර ඇත්තේ, මෙම පී.ඩබ්ලිව්.අබේරත්න මහතා විසින් පාලින්ද ලාල් පියරත්න යන අයව අත්අඩංගුවට ගැනීමට අදාළ විමර්ශන කළ බවත්, ඔහුගේ මැදිහත්වීම මත මෙම අත්අඩංගුවට ගැනීම සිදුවූ බවත්ය. එබැවින් එම කරුණු පදනම්ව උප පොලිස් පරීක්ෂක

පී.ඩබ්ලිව්.අබේරත්න යන අය කොමිෂන් සභාව වෙත කැඳවා ඇති අතර, ඒ අනුව පී.ඩබ්ලිව්.අබේරත්න යන අය ප්‍රකාශ කර ඇත්තේ, මෙම අයගේ අත්අඩංගුවට ගැනීම සඳහා තමාගේ කිසිදු සම්බන්ධතාවයක් නොමැති බවය. අදාළ අත්අඩංගුවට ගැනීම අපරාධ අංශය මඟින් සිදුකර ඇති බවත්, මෙම පැමිණිලිකරුට අදාළ නඩුවේ නඩු මෙහෙයුම් නිලධාරියා ලෙස පමණක් තමා කටයුතු කරන බවත්ය.

විමර්ශනය :-

අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපතිගේ උපදෙස් පරිදි පොලිස් කොස්තාපල් 5926 විසින් සැකපිට ප්‍රශ්න කිරීම සඳහා පැමිණිලිකරුව 2017.11.07 දින අත්අඩංගුවට ගෙන ඇත.

2013.06.25 වන දින සිදුව ඇති මනුෂ්‍ය ඝාතනය සම්බන්ධයෙන් පොලිසිය සිදුකරන ලද විමර්ශනයේ ජයසිංහ මුදියන්සේලාගේ රත්නායක යන අයගේ ප්‍රකාශ සටහන් කර ඇති අතර, එම ප්‍රකාශයේ "ගාමිණීගේ මරණය සූරේගේ (මෙහි පැමිණිලිකරු නාලක) කට්ටිය ගෙන්නලා කරන්න ඇති කියලා මට හිතෙනවා" යනුවෙන් ප්‍රකාශ කර ඇත.

අගතියට පත් ටී. පාලින්ද විසින් 2017.10.25 වන දින ඔහුගේ නිවස අසල ඇති බුදු පිළිමයක මල් ආසනය කඩා අනර්ථයක් සිදුකිරීම සම්බන්ධයෙන් පොලීසිය විසින් සිදුකර ඇති විමර්ශනයට අදාළ සාක්ෂි සටහන් ද කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත.

අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපතිගේ උපදෙස් පරිදි පොලිස් කොස්තාපල් 5926 විසින් පාලින්ද යන අයව සැකපිට ප්‍රශ්න කිරීම සඳහා 2017.11.07 දින අත්අඩංගුවට ගැනීම සිදුකර ඇති අතර, ටී. පාලින්ද යන අයට එරෙහිව අංක ම/උ $B\ 345/2013$ යටතේ ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇත. මෙම නඩුව ගරු අධිකරණයේ විභාග වී ඇති අතර, පැමිණිලිකරුව එම නඩුවෙන් 2018.10.22 දින නිදහස් කර ඇත.

නිරීක්ෂණ :-

අගතියට පත් පැමිණිලිකරු තම පැමිණිල්ල මඟින් ප්‍රකාශ කර ඇත්තේ, කිසිදු සාධාරණ හේතුවක් නොමැතිව තමාව අත්අඩංගුවට ගැනීමෙන් වගඋත්තරකරුවන් තම අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට වේ.

වගඋත්තරකරුවන් ප්‍රකාශ කර ඇත්තේ, 2013.06.25 වන දින තම පොලිස් වසමේ සිදුවූ මිනීමැරුමක් සම්බන්ධයෙන් කරන ලද විමර්ශනයේදී ලද සාධාරණ තොරතුරු හා සැකය මත පදනම්ව මෙම පැමිණිලිකරු අත්අඩංගුවට ගෙන ඇති බවත්, මෙම අත්අඩංගුවට ගැනීමෙන් පැමිණිලිකරුගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුව නොමැති බවත්ය.

දෙපාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති කරුණු සලකා බැලීමේදී 2013.06.25 වන දින ගිරිබාව පොලිස් වසමේදී මනුෂ්‍ය ඝාතනයක් සිදුව ඇති බවත්, මෙම මනුෂ්‍ය ඝාතනය සම්බන්ධයෙන් ගිරිබාව පොලීසිය 2013.06.25 දින සිටම විමර්ශනය සිදුකර ඇති බවත් නිරීක්ෂණය වේ. මෙම මනුෂ්‍ය ඝාතනය සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් විසින් විමර්ශනය සිදුකරමින් සිටියදී 2017.10.25 වන දින හෙට්ටිආරච්චිගම, වදුරාගල ප්‍රදේශයේ බුදු මැදුරක මල් ආසනයක් කඩා දැමීම පිළිබඳව පැමිණිල්ලක් පොලීසිය වෙත ලැබී ඇති අතර, එම පැමිණිල්ල සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකර සාක්ෂිකරුවන්ගෙන් ප්‍රකාශ සටහන් කරගෙන ඇත. මෙම සාක්ෂි සටහන් කර ගැනීමේදී පැමිණිලිකාර ටී.පාලින්ද යන අය විසින් බුදු පිළිමයක මල් ආසනය කඩා අලාභහානි සිදුකර ඇති බවටත්, එමෙන්ම මෙම පැමිණිලිකරු විසින් බුදු මැදුර වටේ ඇති වැට කඩා දැමූ බවටද සාක්ෂි සටහන් කර ඇත. මෙම සිදුවීමට අදාළව සාක්ෂි ලබා ගැනීමේදී 2013.06.25 දින ගිණි අවියකින් වෙඩි තබා ඝාතනයට ලක්ව තිබූ හේරත් මුදියන්සේලාගේ නිහාල් සමරවීර නොහොත් ගාමිණී යන අයගේ මරණය සිදුකළේ මෙම පැමිණිලිකරු විසින් බවට ඔහු ප්‍රකාශයක් කළ බවටද සාක්ෂි ලබාදී ඇත.

බුදු පිළිමයක මල් ආසනය හා එහි වැට කඩා අනර්ථයක් සිදුකිරීම සම්බන්ධයෙන් පොලීසිය වෙත ලද පැමිණිල්ල හා ඒ අනුව ලබා ගත් සාක්ෂි පදනම්ව මෙම පැමිණිලිකරුව 2017.11.07 වන දින පැය 20.50ට අත්අඩංගුවට ගෙන 2013.06.25 හෝ ඊට ආසන්න දිනයකදී බෝගහයාය, හෙට්ටිආරච්චිගම, වරාවැව ලිපිනයේ පදිංචි හේරත් මුදියන්සේලාගේ නිහාල් සමරවීර නොහොත් ගාමිණී යන අයට තවත් පිරිසක් සමඟ ගිණි අවියකින් වෙඩි තබා ඝාතනය කිරීම සම්බන්ධයෙන් චෝදනාකර ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති බව නිරීක්ෂණය වේ.

මෙම පැමිණිලිකාර (අගතියට පත්) පාලින්ද ලාල් පියරත්න යන අයව අත්අඩංගුවට ගැනීමට වගඋත්තරකරුවන්ට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ 2017.10.25 වන දින බුදු පිළිමයක මල් ආසනය කඩා එහි වැට කඩා දැමීමක් පිළිබඳව ගිරිබාව පොලීසිය වෙත ලද පැමිණිල්ල මත පදනම්ව වේ. ඒ අනුව මෙම පැමිණිල්ල විමර්ශනය කළ වගඋත්තරකරුවන් මෙම අය මනුෂ්‍ය ඝාතනයක් සිදුකර ඇති බවට ඔහු විසින් ප්‍රකාශ කරන ලද බවට සාක්ෂිකරුවන් විසින් සාක්ෂි ලබාදීම සිදුකිරීම මතම පමණක් පදනම් වෙමින් මෙම පාලින්ද ලාල් පියරත්න මනුෂ්‍ය ඝාතනයක් සිදුකර ඇති බවට චෝදනා කරමින් ගරු අධිකරණය වෙත කරුණු වාර්තා කර ඇති බව නිරීක්ෂණය වේ.

සියළු පාර්ශවයන් විසින් මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති කරුණු, ලේඛන සලකා බැලීමේදී ගිරිබාව වසමේ 2013.06.25 දින හෝ ඊට ආසන්න දිනයක මනුෂ්‍ය ඝාතනයක් සිදුව ඇති බවත්, මෙම මනුෂ්‍ය ඝාතනය පිළිබඳව වගඋත්තරකරුවන්ට කිසිදු තොරතුරක් අනාවරණය කර ගැනීමට නොහැකිව තිබියදී මෙම පැමිණිලිකරුට එරෙහිව පොලීසිය වෙත ලද වෙනත් පැමිණිල්ලක් සම්බන්ධයෙන් කරන ලද විමර්ශනයේදී ලබා ගත් සාක්ෂි මත පදනම්ව මෙම පැමිණිලිකරු අදාළ මනුෂ්‍ය ඝාතනය සිදුකළ බවට පැමිණිලිකරුට එරෙහිව චෝදනා ගොනු කරමින් වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට එරෙහිව කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ. 1979 අපරාධ නඩු විධාන සංග්‍රහයේ 32(අ) වගන්තිය ප්‍රකාරව වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත හැක්කේ සාධාරණ පැමිණිල්ලක්, තොරතුරක් හා ඔත්තුවක් මත පමණි.

එසේම මෙම පැමිණිලිකරුට එරෙහිව ගරු අධිකරණයේ පවරා ඇති නඩුව විභාග කර මේවන විට පැමිණිලිකරුව නිදහස් කර ඇති අතර, මෙම නඩුව විභාගයට ගැනීමේදී වගඋත්තරකරුවන් විසින් ගරු අධිකරණය වෙත යොමුකර ඇති සාක්ෂිකරුවන් ගරු අධිකරණය ඉදිරියේ කැඳවා සාක්ෂි ලබාගෙන ඇත. එලෙස සාක්ෂි ලබාගැනිමේදී සාක්ෂිකරුවන් සාක්ෂි ලබාදී ඇත්තේ, මෙම පැමිණිලිකරු සම්බන්ධයෙන් සාකෂිකරුවන් විසින් නොකළ ප්‍රකාශ පොලීසිය විසින් ගරු අධිකරණය වෙත යොමුකර ඇති බවට වේ.

එමෙන්ම වගඋත්තරකරුවන්ගේ විමර්ශන සටහන් සලකා බැලීමේදී මෙම පැමිණිලිකරු විසින් මනුෂ්‍ය ඝාතනයක් සිදුකර ඇති බවට සාක්ෂි කිසිවක් ලැබී නොමැති බවද නිරීක්ෂණය වේ. වගඋත්තරකරුවන් වෙත ලද සාක්ෂි මගින් නිරීක්ෂණය වන්නේ පැමිණිලිකරු විසින් බුදු පිළිමයක මල් ආසනය කඩා එහි ඉදිකර තිබූ වැටත් කඩා දැමීම පිළිබඳව වරදක් නමුත් වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකරුට එරෙහිව ඇති මෙකී චෝදනාව සම්බන්ධයෙන් නීතිමය පියවර නොගෙන පැමිණිලිකරු මනුෂ්‍ය ඝාතනයක් සිදුකර ඇති බවට ව්‍යාජ චෝදනා ගොනුකර ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සිදුකර ඇති බවද පෙනී යයි.

නිගමනය :-

පැමිණිලිකරු විසින් මනුෂ්‍ය ඝාතනයක් සිදුකර ඇති බවට සාධාරණ තොරතුරු ඉදිරිපත්ව නොතිබියදී ඒ සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනයක් සිදුකර කරුණු තහවුරු කර ගැනීමකින් තොරව පැමිණිලිකරුට එරෙහිව මනුෂ්‍ය ඝාතනයක් සිදුකර ඇති බවට ගරු අධිකරණය වෙත චෝදනා ගොනු කිරීමෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති "නීතිය පසිඳලීම සහ නීතිය ක්‍රියාත්මක කිරීම, නීතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුත්තේය" යන අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01. පළවන වගඋත්තරකාර ස්ථානාධිපති, පො.ප - කේ.වී.පී.සී. දීපාල් යන අය විසින් අගතියට පත් පාර්ශවය වෙත රු. 25,000/- ක මුදලක් ගෙවිය යුතුය.

02. වගඋත්තර පාර්ශවයේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සුදුසු විනය පියවර ගැනීම සඳහා මෙහි පිටපතක් පොලිස්පති, සභාපති, ජාතික පොලිස් කොමිෂන් සභාව වෙතද යොමු කරනු ලැබේ.

2021. 05 . 17 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසූයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

ම.හේ. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
BMICH පරිශ්‍රය, කොළඹ 07.

සැ.යු - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මගින් පැමිණිලි පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සැළැස්විය යුතුය.

B/h